ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA


| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | දිනය<br>திகதி<br>Date. 2026.02.10 |

පැමිණිලිකරු : අලහයියා සිවසුන්දරම් සසිකරන්
ප්‍රධාන අභ්‍යන්තර විගණක,
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,
මඩකලපුව.

වගඋත්තරකරුවන් : 01. ලේකම්
රාජ්‍ය පරිපාලන පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

02. අධ්‍යක්ෂක
ගණකාධිකාරි සේවා අංශය,
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

**<u>පැමිණිලි අංක : HRC/HO/176/25</u>**

<u>පැමිණිල්ලේ කරුණු දැක්වීම සහ ඉල්ලා සිටින සහන</u>

පැමිණිලිකරු විසින් ඉහත අංක දරණ සහ 2025.01.16 දිනැති පැමිණිල්ල ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට ඉදිරිපත් කරමින් කියා සිටින්නේ; ඔහු මඩකලපුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන ගණකාධිකාරි තනතුර සඳහා 2023.01.08 වන දින වව්නියා දිස්ත්‍රික් ලේකම් සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්ගේ නිර්දේශය මත අයදුම්පත්‍රයක් ඉදිරිපත් කල බවත් පසුව රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම් විසින් අදාල තනතුරට ඔහුට වඩා කනිෂ්ඨ නිලධාරිණියක වන ආර්.ගයාත්‍රි මහත්මිය පත් කර ඇති බවත්ය. තවද රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම් රාජ්‍ය සේවා


ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: අංක. 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. இல. 14, ஆர்.ஏ.த.மெல் மாவத்தை, கொழும்பு - 04. No. 14, R.A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairman: 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541/74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.com
දුරකථන: 94 11 2505580 / 81 / 82
ලේකම්: 011 2505521
ක්ෂණික: 1996
වෙබ්: www.hrcsl.lk

කොමිෂන් සභාවට 2024.02.06 වන දින රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 04/2023 යටතේ පැමිණිලිකරු පත් කිරීමට නිර්දේශය ලබා දී තිබුණද මඩකලපුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සේවය කරමින් සිටි ප්‍රධාන අභ්‍යන්තර විගණන නිලධාරිනි ආර්.ගයාත්‍රි මහත්මිය මඩකලපුව දිස්ත්‍රික් ලේකම් ගේ නිර්දේශය මත රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛන ප්‍රකාරව රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශ ලේකම් විසින් පත්කරන ලද බව පසුව ඒ සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේද අනුමැතිය ලබාගෙන ඇති බවත්ය.

තවද පැමිණිලිකරු ප්‍රකාශ කර සිටින්නේ ඔහු ජ්‍යෙෂ්ඨතම ගණකාධිකාරි වන අතර ඔහුගේ ජ්‍යෙෂ්ඨතා අංකය 30 වන බවත් මඩකලපුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට ප්‍රධාන ගණකාධිකාරි ලෙස දැනට පත්ව සිටින ආර්.ගයාත්‍රි මහත්මියගේ ජ්‍යෙෂ්ඨතා අංකය 155 වන බවත් ඇය තනතුරට අදාල මූලික සුදුසුකම්ද සම්පූර්ණ කර නොමැති අයෙකු බවත්ය. ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවා ව්‍යවස්ථාවේ 878/11 හි 17 වන වගන්තිය සහ 1670/33 හි 11 වන වගන්තිය ප්‍රකාරව ආර්.ගයාත්‍රි මහත්මිය සුදුසුකම් නොලබන බවද වැඩිදුරටත් දක්වා තිබේ.

පැමිණිලිකරු අදාල තනතුරට අවශ්‍ය සියලු සුදුසුකම් ලබා ඇති නමුත් එකී තනතුරට අදාලව ඇති හිමිකම අහිමි කර තිබෙන බව පැමිණිල්ලෙන් දක්වා තිබේ. පැමිණිලිකරු රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය හරහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවට අභියාචනයක් ඉදිරිපත් කල නමුත් පැමිණිලිකරුගේ අභියාචනය සහ අනෙකුත් සුදුසුකම් සලකා බැලීමකින් තොරව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් එකී අභියාචනය නිෂ්ප්‍රභා කල බවද තවදුරටත් ප්‍රකාශ කර සිටි. පැමිණිලිකරු සහන වශයෙන් ඉල්ලා ඇත්තේ ඔහුව මඩකලපුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන ගණකාධිකාරි තනතුරට පත් කරන ලෙස වගඋත්තරකාර පාර්ශවයට, ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවා ව්‍යවස්ථාවට අනුව පත් කිරීමට නියම කරන ලෙසත් පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම් වගඋත්තරකාර පාර්ශවය විසින් උල්ලංඝණය කර ඇති බවටත් නිර්දේශයක් ලබා දෙන ලෙසත්ය.

තවද පැමිණිලිකරු අදාල පැමිණිල්ල සමග අමුණා ඇති ලිඛිත දේශනය තුලින් ඔහුට සිදු වි ඇති අසාධාරණය පිළිබඳව කරුණු වාර්තා කර ඇති අතර, ඒම ලේඛනයේ අවසාන ඡේදයේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ iii වන පරිච්ඡේදයේ 12 (1) ව්‍යවස්ථාව යටතේ වූ "නීතිය ඉදිරියේ සෑම කෙනෙකුම සමානයි, තවද ඔවුන් නීතියෙන් සමව ආරක්ෂා කිරීමට හිමිකම් ඇත්තෝය." යන ස්වභාවික යුක්තියේ මූලධර්මයට අනුව යුක්තිය ලබා දෙන මෙන් වැඩිදුරටත් අයැද සිටි.

පැමිණිලිකරු තම පැමිණිල්ල සමග අමුණා ඇති ලේඛන අනුව, අංක HA/01/01/04/13 දරණ සහ 2024.10.04 දිනැති ලිපියෙන් අධිකරණ රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු පළාත් සභා පළාත් පාලන සහ කම්කරු අමාත්‍යාංශයේ ලේකම් විසින් "ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවයේ නිලධාරින් 1 ශ්‍රේණියේ

තනතුරු වලට පත් කිරීම්, ඒ.එස්.සසිකරන් මහතා (ශ්‍රී ලංගසේ) 1 ශ්‍රේණිය යන ශිර්ෂය" යන ශිර්ෂය යටතේ වව්නියාව දිස්ත්‍රික් ලේකම් අමතා දක්වා ඇත්තේ මඩකලපුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන අභ්‍යන්තර විගණක තනතුරට පත් කිරිම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව අනුමැතිය ලබා දි ඇති බවය. එය එම කොමිෂන් සභා ලේකම්ගේ අංක PSC/PRO/07/2072/2024 හා 2024.09.10 දිනැති ලිපියෙන් දන්වා ඇති බව අධ්‍යක්ෂක (ගණකාධිකාරි සේවා)ගේ අංක MPubAd/AcSD/1996 හා 2024.09.13 දිනැති ලිපියෙන් දන්වා ඇති බව සඳහන් කර සිටි. තවද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් අංක PSC/APP/6/104(ii)/2012 දරණ සහ 2013.02.26 දිනැති ලිපියෙන් ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවයේ 11 ශ්‍රේණියේ සිට ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවයේ 1 ශ්‍රේණියට පත් කර බවත් ඔහු ශ්‍රී ලංකා නැගෙනහිර විශ්ව විද්‍යාලයේ වාණිජ විද්‍යාවේදි උපාධියද, ශ්‍රී ලංකා අග්නිදිග විශ්ව විද්‍යාලයේ ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ පශ්වාත් උපාධියද ලබා ගෙන ඇති බවත්, ASSOCIATION OF PUBLIC FINANCE ACCOUNTANTS OF SRI LANKA ආයතනයේ සාමාජිකයෙකු බවත් ඔහු විසින් පැමිණිල්ල සමග අමුණා ඇති ලේඛන වලින් සනාථ වේ.

මෙම පැමිණිල්ල පිළිබඳව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වගඋත්තරකාර රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු පළාත් සභා අමාත්‍යාංශයේ ලේකම්ගෙන් වාර්තාවක් කැඳවා ඇති අතර 2025.07.24 දින කොමිෂන් සභාව ඉදිරියේ පෙනී සිටින ලෙස ඉහත කී පාර්ශවකරුවන්ට සිතාසි යොමු කර තිබූ අතර, වගඋත්තරකාර පාර්ශවය වෙනුවෙන් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය අධ්‍යක්ෂක අයි.යු.පි.ගුණවර්ධන, නියෝජ්‍ය අධ්‍යක්ෂක ඒ.ඒ.කේ.පෙරේරා සහ කළමනාකරන සහකාර නිලධාරිනි එම්.එච්.යු.මදුමාලි යන අය පමණක් පෙනි සිට ඇත. පැමිණිලිකරු ඒ දින පරික්ෂණය සඳහා පෙනි සිට නොමැත.

<u>වගඋත්තරකරුගේ කරුණු දැක්විම</u>

වගඋත්තරකාර රාජ්‍ය පරිපාලන පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට අංක MPubAd/AcSD/1996 දරණ සහ 2025.06.04 දිනැති වාර්තාව එවා ඇත. අදාල වාර්තාවේ 2 වන අයිතමයේ 1 වන ඡේදයට අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල පුරප්පාඩුව පැවති ප්‍රධාන ගණකාධිකාරි තනතුරු 9 ක් හා ප්‍රධාන අභ්‍යන්තර විගණක තනතුරු 3 ක් සඳහා ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවයේ 1 ශ්‍රේණියේ සුදුසුකම් ලත් නිලධාරින් තෝරා ගැනිමට 2023.02.20 හා 2023.06.29 දිනැතිව අයදුම්පත් කැඳවා 2023.07.18 සහ 19 යන දිනයන්හිදි සම්මුඛ පරික්ෂණ පවත්වා ඇති බව දක්වා තිබේ. 2 වන ඡේදයේ එම සම්මුඛ පරික්ෂණයේදි අනුමත ලකුණු පරිපාටිය අනුව පැමිණිලිකාර ඒ.ඒස්.සසිකරන් ලබා ඇති මුලු ලකුණු සංඛ්‍යාව 76.48 ක් වූ බවද තවත් අයදුම්කරුවෙකු වන එම්.එස්.බශිර් මහතා ලබා ඇති මුලු ලකුණු සංඛ්‍යාව 87.05 ක් බවද සඳහන් වේ. ඒ අනුව ඉල්ලුම් කර ඇති අනුපිලිවෙල හා ලබා ඇති මුලු ලකුණු අනුපිලිවෙල අනුව එම්.එස්.බශිර් මහතා මඩකලපුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන ගණකාධිකාරි තනතුරටත්

ඒ.එස්.සසිකරන් මහතා වව්නියාව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන ගණකාධිකාරි තනතුරටත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ අංක PSC/PRO/07/1887/2022 හා 2023.09.28 දිනැති ලිපිය මගින් ලද අනුමැතිය පරිදි පත් කල බව සඳහන් කර සිටින ලදී. අදාල වාර්තාවේ 2 වන අයිතමයේ අනු අංක iii යටතේ 2024 වර්ෂයට අදාලව පැවති ශ්‍රීලංගසේ 1 ශ්‍රේණියේ පුරප්පාඩු වූ තනතුරු සඳහා ශ්‍රීලංගසේ 1 ශ්‍රේණියේ නිලධාරින්ගෙන් 2023.12.17 දිනැතිව අයදුම්පත් කැඳවා තිබූ බවත් අනු අංක iv අනුව මඩකලපුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන ගණකාධිකාරි ඒම්.එස්.බශීර් මහතා 2024.08.06 දිනැතිව විශ්‍රාම යාම හේතුවෙන් පුරප්පාඩු විමට නියමිතව පැවති එම ප්‍රධාන ගණකාධිකාරි තනතුර සඳහා පැමිණිලිකාර ඒ.එස්.සසිකරන් මහතා ඉල්ලීම් කර තිබූ අතර එම ඉල්ලීම් සඳහා මඩකලපුව දිස්ත්‍රික් ලේකම්ගේ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණු බව වගඋත්තරකාර රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම් සඳහන් කර සිටි.

අනු අංක v යටතේ මඩකලපුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන අභ්‍යන්තර විගණක තනතුරෙහි සේවයේ නියුතු ශ්‍රීලංගසේ 1 ශ්‍රේණියේ ආර්.ගයාත්‍රි මියද මඩකලපුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන ගණකාධිකාරි තනතුර සඳහා ඉල්ලීම් කර තිබූ අතර ඒම ඉල්ලීම මඩකලපුව දිස්ත්‍රික් ලේකම්ගේ අංක ADM/SLAS/Con/MS04/2024 හා 2024.06.03 දිනැති ලිපිය මගින් නිර්දේශ කර තිබූ බව ප්‍රකාශ කර සිටි.

තවද අංක 6 ඡේදයේ ස්වදේශ කටයුතු අංශයේ අතිරේක ලේකම්ගේ HA/01/01/04/15 හා 2024.07.01 දිනැති ලිපිය මගින් 2024.08.06 දින සිට මඩකලපුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පුරප්පාඩු විමට නියමිත ප්‍රධාන ගණකාධිකාරි තනතුරට ආර්.ගයාත්‍රි මිය පත් කිරිමටත් (ශ්‍රීලංගසේ) පුරප්පාඩු වූ 1 ශ්‍රේණියේ ප්‍රධාන අභ්‍යන්තර විගණන තනතුරට ඒ.ඒස්.සසිකරන් මහතා පත් කිරිමට නිර්දේශ කර ඇති බව සඳහන් කර සිටි. අදාල වාර්තාවේ ඡේද අංක 7 අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 04/2023 හි 6:1 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව අදාල පුරප්පාඩුව පවතින ආයතන වල ආයතන ප්‍රධානින් හට ඒ සඳහා සුදුසු නිලධාරියෙකු තෝරා ගැනිමට ඇති අවස්ථාව අනුව මඩකලපුව දිස්ත්‍රික් ලේකම්ගේ ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ අතිරේක ලේකම්ගේ නිර්දේශය සැලකිල්ලට ගෙන මඩකලපුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන අභ්‍යන්තර විගණක තනතුරේ සේවයේ නියුතු ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවයේ 1 ශ්‍රේණියේ ආර්.ගයාත්‍රි මිය 2024.08.06 දින සිට පුරප්පාඩු වන මඩකලපුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන ගණකාධිකාරි තනතුරට පත් කිරිමටත් ඒමගින් පුරප්පාඩු වන මඩකලපුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන අභ්‍යන්තර විගණක තනතුර සඳහා වව්නියාව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන ගණකාධිකාරි තනතුරේ සේවයේ නියුතු ශ්‍රී ලංගසේ 1 ශ්‍රේණියේ ඒ.ඒස්.සසිකරන් මහතා පත් කිරිමටත් නිර්දේශ කර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය සඳහා අංක MPubaD/Ac/SD/1996 හා 2024.07.18 දිනැති ලිපිය මගින් ඉදිරිපත් කල බවත් ඒ අනුව ඉහත සඳහන් පරිදි තනතුරු වලට පත් කිරිම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය

ලබා දී ඇති බව එම කොමිෂන් සභා ලේකම්ගේ අංක PSC/PRO/07/2072/2024 හා 2024.09.10 දිනැති ලිපිය මගින් දැනුම් දුන් බව එම වාර්තාවේ සඳහන් කර තිබේ.

අදාළ වාර්තාවේ 8 වන ඡේදයේ රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 04/2023 හි 6:1 වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව මඩකලපුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන අභ්‍යන්තර විගණක තනතුර සඳහා එ.එස්. සසිකරන් මහතා ද ප්‍රධාන ගණකාධිකාරී තනතුර සඳහා ආර්.ගයාත්‍රි මියද අදාල පත්කිරීම් බලධරයා වන රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කර ඇති බව සඳහන් කර සිටී. තවද අදාල වාර්තාවේ අයිතම් අංක 3 හි අංක 1670/33 හා 2010.09.10 දිනැති ගැසට් නිවේදනය මගින් ප්‍රකාශයට පත් කර ඇති ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවා ව්‍යවස්ථාව ( වර්තමානයේදි බලාත්මකව පවතින) අනුව තනතුරු වලට පත් කිරීමේදි නිලධාරියා විසින් ලබා ගෙන ඇති අතිරේක සුදුසුකම් ඇගයීමේ ක්‍රියාපටිපාටිය අනුගමනය නොකරන බව හා මේ වන විට 1 ශ්‍රේණියේ තනතුරු සඳහා පත් කිරීම රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 04/2023 අනුව සිදු කල යුතු බව දන්වා සිටී. ඒ අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නියම කර ඇති ක්‍රමවේදය යටතේ එම කොමිෂන් සභාව විසින් අදාල පත්කිරීම් සිදු කර ඇති බව වගඋත්තරකාර රාජ්‍ය පරිපාලන පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් ඔහුගේ වාර්තාවේ දක්වා ඇත.

<u>නිරීක්ෂණ</u>

වගඋත්තරකාර රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම් ඔහුගේ ලිඛිත වාර්තාව සමග මානව හිමිකම් කොමිෂන් සභාවට ඒවන ලද ඇමුණුම් සම්බන්ධව සලකා බැලීමේදි අංක POL/DST/HRM/02/01/005 දරණ සහ 2023.03.08 දිනැති ලිපිය ප්‍රකාරව පැමිණිලිකාර ඒ.ඒස්.සසිකරන් මහතා මඩකලපුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පුරප්පාඩු වූ ප්‍රධාන ගණකාධිකාරී තනතුර සඳහා අයදුම්පත්‍රයක් ඉදිරිපත් කර ඇති බව නිරීක්ෂණය වේ. තවද වගඋතරකාර රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශ ලේකම් විසින් පැමිණිලිකරුට අදාල තනතුරට සුදුස්සන් තෝරා ගැනීම සඳහා පැවැත්වූ සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීමට අවශ්‍ය අංක HA01/1/01/04/26 දරණ සහ 2023.07.16 දිනැති ලිපිය නිකුත් කර ඇති බවද පැමිණිලිකරු ඊට අදාල අයදුම්පත්‍රයද යොමු කර ඇති බවද නිරීක්ෂණය වේ. ලකුණු අනු පිලිවෙල අනුව එම්.එස්.බශිර් මහතා මඩකලපුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන ගණකාධිකාරී තනතුරට පත් කර ඇති බවද ඉදිරිපත් කල කරුණු අනුව තහවුරු වේ.

තවද මඩකලපුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන ගණකාධිකාරී තනතුරේ නියුතු එම්.එස්.බශිර් මහතා 2024.08.06 දින විශ්‍රාම යාම හේතුවෙන් උක්ත තනතුර පුරප්පාඩු වීමට නියමිතව ඇති බවත් ඒම තනතුරට වව්නියා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන ගණකාධිකාරී තනතුරේ නියුතු පැමිණිලිකාර ඒ.එම්.සසිකරන් මහතාද ඉල්ලීම් කර ඇති අතර ඒම ඉල්ලීම් ස්වදේශ කටයුතු අංශයේ අතිරේක ලේකම් විසින් නිර්දේශ කර ඇති බවට අංක MPUBAd/AcSD/Gr.iPostAPP දරණ සහ

2024.06.13 දිනැති ලිපියෙන් සනාථ වේ. අදාල ලිපියට අනුව මඩකලපුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන අභ්‍යන්තර විගණක තනතුරේ නියුතු ආර්.ගයාත්‍රි මිය විසින්ද ඉල්ලීමක් කර ඇති අතර ඒම ඉල්ලීම මඩකලපුව දිස්ත්‍රික් ලේකම්ගේ 2024.06.03 දිනැති ලිපිය මගින් නිර්දේශ කර ඇති බවට තවදුරටත් සනාථ වේ.

තවද අංක HA/01/01/04/15 දරණ සහ 2024.07.01 දිනැති ලිපියට අනුව රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් වෙනුවට අතිරේක ලේකම් (ස්වදේශ කටයුතු) ඒ.පී.නිශාන්ත මහතා විසින් අධ්‍යක්ෂක (ශ්‍රීලංගසේ) රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය වෙත යොමු කර ඇති ලිපියේ, අදාල මඩකලපුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන ගණකාධිකාරි තනතුර සඳහා ඒ.ඒස්.සසිකරන් මහතා පත් කිරිම ඔහු විසින් නිර්දේශ කර අවශ්‍ය ඉදිරි කටයුතු සඳහා ඉදිරිපත් කල බවට සනාථ වේ. කෙසේ වෙතත් පැමිණිලිකරු අදාල තනතුරට පත් කිරිම සිදු නොකල අතර පැමිණිලිකරු පසුව මේ පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාවටද, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය මගින් අභියාචනයක් ඉදිරිපත් කර ඇති බව ගොනුව අනුව නිරික්ෂණය වේ.

කෙසේ වෙතත් පැමිණිලිකරු අදාල ප්‍රධාන ගණකාධිකාරි තනතුරට පත්කර නොමැති බව නිරික්ෂණය වන අතර ඒ පිළිබඳව දක්වා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත වගඋත්තරකාර පාර්ශවය විසින් ඉදිරිපත් කල ලිඛිත වාර්තාවේ පිටපතක්ද පමිණිලිකරුට ලබා දිමට පියවර ගෙන තිබේ. එම වාර්තාවටද පැමිණිලිකරු විසින් නැවත පිලිතුරක් ලබා දෙමින් ප්‍රකාශ කර සිටින්නේ "ශ්‍රී ලංකා ගණකාධිකරණ සේවයේ නිලධාරින් පත් කිරිමේ සම්පූර්ණ බලය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වන අතර මා විසින් ඉල්ලා තිබූ මඩකලපුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන ගණකාධිකාරි තනතුර පුරප්පාඩු විමෙන් අනතුරුව මා පත් කරන ලෙසටද මට ඊට අවශ්‍ය සියලු සුදුසුකම් සපුරා තිබිම පිළිබඳවද දක්වා ඉල්ලා තිබුණත් ඒවකට හිටපු මඩකලපු දිස්ත්‍රික් ලේකම්ගේ සහ රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ වැරදි නිර්දේශය රාජ්‍ය සේවා කොමිෂන් සභාවට එවා තිබිම මත මා හට මෙම පත්විම් අහිමි වූ බවත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව අදාල වගඋත්තරකරුගේ නිර්දේශය මත පමණක් පදනම් වි අදාල අනුමැතිය ලබා දි තිබෙන බව" යන්න ලෙස සඳහන් කර සිටි. "මෙම ක්‍රියාදාමය ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවා ව්‍යවස්ථාවේ 1670/33 හි 11 වන වගන්තිය සහ 878/11 හි 17 වගන්තියද ආයතන සංග්‍රහයේ 2 වන පරිච්ජේදයේ 5 වන වගන්තියද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ රිතී වලට පටහැනිවද ආයතන සංග්‍රහයේ 2 වන වෙලුමේ පරිච්ජේද XL VII හි වගන්ති 1:6 උල්ලංඝණය විමක් බවය" මෙම වැරදි නිර්දේශය නිසා රාජ්‍ය සේවා කොමිෂන් සභාව පැමිණිලිකරුගේ අදාල පත්විම් පිළිබඳව වැරදි අනුමැතියක් වගඋත්තරකාර පාර්ශවයට ලබා දි ඇති බව ඔහු තවදුරටත් සඳහන් කර සිටි.

**පාර්ශවකරුවන් විසින් ඉදිරිපත් කරන ලද ලේඛන වල තවදුරටත් සලකා බැලීමේදි**

- පැම්ණිලිකාර ඒ.එස්.සසිකරන් මහතා ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවයේ 1 වන ශ්‍රේණියේ නිලධාරියෙක් වන අතර, පුරප්පාඩු වූ මඩකලපු දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන ගණකාධිකාරි තනතුර සඳහා ඉල්ලීම් කළ බවටත් අදාළ පුරප්පාඩුව පිරවීම සඳහා පැවති සම්මුඛ පරීක්ෂණයේදී අනුපිළිවෙල අනුව දෙවැනි ස්ථානයේ සිටින ලද බවත් නිරීක්ෂණය වේ.

- අදාළ සම්මුඛ පරීක්ෂණයේදී පළමු ස්ථානයට පත්වූ එම්.එස්.බශීර් මහතා මඩකලපුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන ගණකාධිකාරි තනතුරට රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය විසින් පත් කර ඇති අතර, පැමිණිලිකාර ඒ.එස්.සසිකරන් මහතා වව්නියා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන ගණකාධිකාරි තනතුර සඳහා පත් කර ඇත.

- මඩකලපුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට පත් වූ එම්.එස්.බෂිර් මහතා 2024.08.06 දිනැතිව විශ්‍රාම යාමට නියමිතව තිබූ අතර, පුරප්පාඩු වූ ප්‍රධාන ගණකාධිකාරි තනතුර සඳහා අයදුම්පත්‍ර නැවත කැඳවා තිබුණද ඒ සඳහා වූ කිසිදු සම්මුඛ පරීක්ෂණයක් පවත්වා නැති අතර, පැමිණිලිකාර ඒ.එස්.සසිකරන් මහතා සහ එවකට මකලපුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන අභ්‍යන්තර විගණක තනතුර දැරූ ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවයේ 1 ශ්‍රේණියේ නිලධාරියෙක් වන ආර්.ගයාත්‍රි මහත්මිය ද ඉල්ලීම් කර ඇත.

- ආර්.ගයාත්‍රි මහත්මිය පත්කිරීමට මඩකලපුව දිස්ත්‍රික් ලේකම් විසින් අවශ්‍ය නිර්දේශය කර තිබුණද පැමිණිලිකාර ඒ.එස්.සසිකරන් මහතා පත් කිරීමට අවශ්‍ය නිර්දේශය ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් විසින් නිර්දේශ කර තිබුණ බවද නිරීක්ෂණය වේ.

- පළවෙනි අවස්ථාවේදී මඩකලපුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පුරප්පාඩු වූ ප්‍රධාන ගණකාධිකාරි තනතුරට පත් කිරීමට අයදුම්පත් කැඳවා සම්මුඛ පරීක්ෂණය ද පවත්වා ලකුණු අනුපිලිවෙල අනුව පත් කිරීම් සිදු කර ඇති නමුත් දෙවැනි අවස්ථාවේදී එවැනි සම්මුඛ පරීක්ෂණයක් නොපවත්වා අයදුම්කරුවන් අතරින් මඩකලපුව දිස්ත්‍රික් ලේකම්ගේ නිර්දේශය මත පමණක් තෝරා ගැනීම සිදු කරමින් මෙම පත්වීම් ලබාදී ඇති බව නිරීක්ෂණය වේ. අදාළ පත්වීමේ, පත්වීම් බලධාරියා වන රාජ්‍ය සේවා කොමිෂන් සභාව මෙම පත් කිරීමේදී සුදුසුකම් සහ සම්මුඛ පරීක්ෂණයකින් තොරව නිලධාරියා තෝරා ගැනීම සම්බන්ධව සොයා බැලීමකින් තොරව රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ නිර්දේශය මත පමණක් පදනම් වි පත්කිරීමට අවශ්‍ය අනුමැතිය ලබාදී ඇති බව තවදුරටත් නිරීක්ෂණය වේ. මෙහිදි රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු නිත්‍යානුකුල බලය අන්සතු කිරීමක් සිදුකර තිබේද යන්න පිළිබඳ ගැටලුවක් මතු වේ. රාජ්‍ය සේවා කොමිෂන් සභාවට ලබා දි තිබෙන පත් කිරීමේ බලය එකී සභාව විසින් කල යුතු අතර වෙනත් නිලධාරින් හෝ මණ්ඩලයක් විසින් පුද්ගලයෙකු පත් කිරීමට අවශ්‍ය තීරණය ගැනීම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්යය තවත් අයකු හට අභිනියෝජනයක් කිරීමට

ඉඩ සලසා දීමක් වේ. රාජ්‍ය සේවා කොමිෂන් සභාවට තම බලය අභිනියෝජනය කිරීමට ඉඩ සලසා දිය නොහැකි අතර ඒවැනි නෛතික තත්වයක් මෙම අවස්ථාවේ උද්ගත වී ඇත්තේද නැත.

- මෙහිදි ශ්‍රී ලංකා අභියාචනාධිකරණය විසින් 1998 වසරේ **ගුණරත්න එදිරිව චන්ද්‍රානන්ද** සිල්වා නඩුවේදී දක්වා ඇත්තේ රාජ්‍ය නිලධාරියකු ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් විසින් අනිවාර්ය නිවාඩු යවා ඇති අතර, ඒ සඳහා වු අනුමැතිය රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් ලබාදි ඇති බවද ගරු අධිකරණය විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභවේ ක්‍රියාදාමය ප්‍රශ්නයට ලක් කර ඇති බවදය. අදාළ නඩුවේ පෙත්සම්කරු වන ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති, ආරක්ෂක ලේකම් විසින් අනිවාර්ය නිවාඩු යවා තිබුණද එම අනිවර්ය නිවාඩු යැවීම අත්තනෝමතික ක්‍රියාවක් බවත් එම ක්‍රියාව නිතිය ඉදිරියේ බලරහිත ක්‍රියාවක් බවත් තවදුරටත් තීරණය කර සිටින ලදි. මෙහිදි සැලකිය යුතු කරුණු වන්නේ පෙත්සම්කරුව අනිවාර්ය නිවාඩු යැවීමට ආරක්ෂක ලේකම් විසින් නිර්දේශ කර එම නිර්දේශය අනුමැතිය සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවට එවා තිබුණු අතර හුදෙක්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ විනය පියවර ගැනිමේ බලය කිසිකෙනෙකුට අන්සතු කිරිමක් කළ නොහැකි බවත් මෙම පෙත්සම්කරු අනිවාර්ය නිවාඩු යැවීමට ආරක්ෂක ලේකම් විසින් ගත් තිරණය බල රහිත බවත් තවදුරටත් තීරණය කර සිටින ලදී. අදාල නඩුවේ ලබා දි ඇති තීරණය පහත පරිදි වේ.

**<u>Gunaratne v. Chandrananda De Silva C.A. NO 927/98,</u>** *The petitioner a senior deputy inspector general of police was sent on compulsory leave by letter dated 17.08.96 by the secretary /defense as the Commission of inquiry (Batalanda Commission) had made adverse findings against the petitioner*

*It was contended that the decision to place the petitioner on compulsory leave is ultra vires and therefore is void in law for the reason that the said decision has not been taken by the proper authority-P.S.C.*

*It was very clear that it was the respondent who has decided to place the petitioner on compulsory leave and had thereafter recommended to the PSC that approval be granted to place petitioner on compulsory leave.*

අදාල නඩුවේ තීරණයට අනුව අනිවාර්යය නිවාඩු යැවීම සාධාරණ වුවත් ඒම තීරණය ගැනිමට අනුගමනය කල ක්‍රමවේදය නීතියට පටහැනි බවත් ගරු අධිකරණය විසින් තීන්දු කරන ලදි.

- ඒ ආකාරටයම ගරු ශ්‍රේෂ්ඨාධිකරණය විසින් <u>නඩු අංක **286/24**</u> දී 2024 වර්ෂයේදී පැවැත්වු 5 වසර ශිෂ්‍යත්ව විභාගයේ දි සිදුවු අක්‍රමිකතා සම්බන්ධයෙන් තිරණ ගැනිමේදි විභාග පනත ප්‍රකාරව සම්පූර්ණ බලය තිබෙන්නේ විභාග කොමසාරිස් ජනරාල්ට වුවද ඒ පිළිබඳව

අධ්‍යාපන අමාත්‍යවරයා සහ අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් තීරණය කිරීම නීතියට පටහැනි අත්තනෝමතික නීති විරෝධී සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 (1) වගන්තියට විරුද්ධ තීරණයක් බව දක්වා සිටින ලදී. එබැවින් එම තීරණය බලරහිත තීරණයක් බව ගරු ශ්‍රේෂ්ඨාධිකරණය විසින් පෙන්වා දී ඇත. අදාල නඩුවේ ලබා දී ඇති තීරණය පහත පරිදි වේ.

*It is declared that the impugned purported decision of the 1st Respondent-Commissioner General of Examination to award free marks for three answers corresponding to the three compromised questions in part 1 of the grade 5 Scholarship Examination held on 15th September 2024 has been taken contrary to law, is ultra vires, and thus unlawful. In the circumstances of this case the said decision is a nullity, it contravenes article 12(1) of the constitution.* ලෙස තීරණය කර ඇත.

- අදාල නඩු තීන්දු වලින් පැහැදිලි වන්නේ රාජ්‍ය නිලධාරියෙක් හෝ මණ්ඩලයක් විසින් තමන්ට නීත්‍යානුකුලව ලැබී ඇති බලතල ප්‍රකාරව කටයුතු කිරීම කිසිසේත්ම අන්සතු කිරීමක් කළ නොහැකි බවත් එම අන්සතු කිරීම නීතියට පටහැනි බවත්ය. මෙම පැමිණිල්ලේදී රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කළ යුතු පත්වීම්; රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම්ගේ නිර්දේශය මත අනුමත කිරීම තුළ තමන්ගේ බලය අන්සතු කිරීමක් සිදු කර ඇති බව නිරීක්ෂණය වේ. එබැවින් පැමිණිලිකාර ඒ.එස්.සසිකරන් මහතා මුල් අවස්ථාවේදී අදාළ තනතුරට පත්වීමට සම්මුඛ පරීක්ෂණයට පෙනී සිට ලකුණු අනුපිළිවෙල අනුව දෙවන ස්ථානයට පත්ව ඇතත් මඩකලපුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ එම තනතුරු පුරප්පාඩු වන අවස්ථාවේ දී ඔහුව පත් නොකර වෙනත් නිලධාරිනියක් පත් කිරීම තුලින් අදාල තනතුරට පත් කිරීමේදී අනුගමනය කල යුතු අවශ්‍ය ක්‍රමවේදයෙන් බැහැරව මෙම පත්කිරීමට අවශ්‍ය අනුමැතිය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ලබා දී ඇති බවට ලේඛණ වලින් නිරීක්ෂණය වේ. තවද ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ 1 ශ්‍රේණියේ නිලධාරින්ගේ පත්වීම් බලධාරියා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වන අතර මෙම පැමිණිල්ලේ සඳහන් පරිදි මඩකලපුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන ගණකාධිකාරී තනතුර පුරප්පාඩු වූ අවස්ථාවේදී අදාල තනතුරට සුදුසු නිලධාරියෙක් පත් කිරීමේ ක්‍රියාදාමය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කල යුතුව තිබූ අතර, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ නිර්දේශය මත පමණක් පදනම්ව නිලධාරියෙක් පත් කිරීමට අවශ්‍ය අනුමැතිය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කිරීම තුල බලය අන්සතු කිරීමක් සිදු වී තිබෙන බවට ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ මතය වේ. ඒ අනුව පැමිණිලිකාර ඒ.ඒස්.සසිකරන් මහතාට මෙම පත්වීම් ලබා දීම තුල අසාධාරණයක් සිදුවී තිබෙන බවට කරුණු සනාථ වේ.

- මෙහිදි අනාවරණය වන කරුණු අනුව පලමු සමුම්බ පරික්ෂණයේදි 2 වන ස්ථානය ලැබු පැමිණිලිකරුට, පලමු ස්ථානය ලැබු අයදුම්කරුගෙන් සම්පූර්ණ කරනු ලැබු පුරප්පාඩුව හිස් වු විට යම් ක්‍රමවේදයක් යටතේ එය ලබා ගැනීමේ නීතිමය අපේක්ෂාවක් පවතින බව නිරික්ෂණය වේ.

**නිගමනය**

මෙම පැමිණිල්ලට අදාලව මඩකලපුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පුරප්පාඩු වු ප්‍රධාන ගණකාධිකාරි තනතුර සඳහා දැනට පත් කර සිටින ආර්.ගයාත්‍රි මහත්මිය, එම තනතුරට අදාළව පැවති පලමු සම්මුඛ පරික්ෂණයට සහභාගි වූ බවක් අනාවරණය නොවන අතර පැමිණිලිකරු ඊට සහභාගි වී දෙවන ස්ථානය ලබා ගෙන ඇත. එහිදි එකී සම්මුඛ පරික්ෂණයෙන් වැඩිම ලකුණු ලැබු එම්.එස්.බශිර් මහතා ගණකාධිකාරි තනතුර සඳහා පත්කර ඇත. එසේම ගණකාධිකාරි සේවයේ ජොෂ්ඨත්වයෙන් දැනට පත් කර සිටින ආර්.ගයාත්‍රි මහත්මිය පැමිණිලිකරුට වඩා පහලින් සිටින බව ඉදිරිපත්ව ඇති ලේඛන අනුව නිරික්ෂණය වේ.

එසේම, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 4/2023 චක්‍රලේඛනයේ 6(1) වගන්තිය අනුව ආයතන ප්‍රධානීන්ට සුදුසු නිලධාරියෙකු පත්කර ගත හැකි වුවද, එය අත්තනෝමතික හෝ අභිමතානුසාරි ලෙස ක්‍රියා කිරීමට දෙන නිරපේක්ෂ බලයක් නොවේ. එහිදි ද අදාල නිලධාරින් විසින් ස්වභාවික යුක්ති මුලධර්මයන්ට අනුකුලව හා විනිවිදභාවයෙන් යුතු යම් ක්‍රමවේදයක් අනුගමනය කරමින් ක්‍රියාත්මක විය යුතුය. මෙම පත්විම සිදු කිරිමේදි එවැනි ක්‍රමවේදයක් අනුගමනය කර ඇති බවක් නිරික්ෂණය නොවේ.එසේහෙයින් 1978 ශ්‍රී ලංකා නව ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මුලික අයිතිවාසිකම් පිළිබඳ වු III පරිච්චේදයේ 12(1) ව්‍යවස්ථාව මගින් සුරක්ෂිත කොට ඇති නීතිය පසිඳලිම හා ක්‍රියාත්මක කිරිම ද නීතියේ රැකවරණය ද සර්ව සාධාරණ වියයුතුය යන පැමිණිලිකරුගේ මුලික අයිතිවාසිකම වගඋත්තරකාර පාර්ශවය විසින් උල්ලංඝණය කර ඇති බව මෙයින් නිගමනය කරනු ලැබේ.

**ඒ අනුව පහත සඳහන් නිර්දේශය ඉදිරිපත් කර සිටි.**

මඩකලපු දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන ගණකාධිකාරි තනතුර සඳහා නිසි ක්‍රමවේදය යටතේ සම්මුඛ පරික්ෂණයක් පවත්වා සුදුසුකම් ලත් නිලධාරියෙකු පත් කිරිමට 01 වන වගඋත්තරකරු විසින් කටයුතු කළ යුතුය.

2026. 03 . 24 වන දිනට පෙර මෙකී නිරිදේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාව වෙත ලැබීමට සලස්වන ලෙසට 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 (7) වගන්තියට ප්‍රකාරව වගඋත්තර පාර්ශවය වෙත මෙයින් දන්වා සිටිමු.

එසේම පැමිණිලිකරු විසින්ද එකී නිර්දේශය ක්‍රියාත්මක කර ඉදිරිපත් කිරිමට නියමිත දින සිට සතියක කාලයක් තුල මෙම නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධයෙන් කොමිෂන් සභාව වෙත දැනුම්දීය යුතු වන අතර, ඒදිනට පෙර අදාළ දැනුම්දීම සිදුනොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම සම්බන්ධයෙන් සලකා නොලබන බව වැඩිදුරටත් දන්වා සිටිමු.

එල්.ටී.බී.දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (හිටපු),
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

විනිසුරු එල්.ටී.බී.දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී.පුංචිහේවා
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

නිමල් ජී. පුංචිහේවා
ජ්‍යෙෂ්ඨ නීතිඥ
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

පිටපත : අමාත්‍යතුමා
රාජ්‍ය පරිපාලන පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.